# <u>ඌව පළාතේ, පළාත් සභාවේ 2011 අංක 07 දරණ ඌව පළාත් සභාවේ,</u>
# <u>කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය</u>
## <u>ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව</u>

**2011 අංක 7 දරණ ඌව පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය**

- ඌව පළාත තුළ පළාත්බද කාර්යය සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපන හා කෘෂිකාර්මික පර්යේෂණ (නාමෝදිෂ්ඨ ආයතන හැර) මඟින් ඌව පළාතේ ගොවිජනතාවගේ ජීවන තත්වය උසස් කරලීම පිණිස මනා සම්බන්ධීකරණයක් මෙන්ම, මනා කළමනාකරණයක් පවත්වා ගනිමින්, නවීන තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදී කෘෂිකර්ම සංවර්ධනය ඉහල තලයකට ගෙන ඒමෙන් ගොවිජනතාවගේ ජීවන තත්වය උසස් කරලීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලබන ප්‍රඥප්තියකි.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.**

- **ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය**

මෙම ප්‍රඥප්තිය 2011 අංක 7 දරණ ඌව පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර, ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට ක්‍රියාත්මක වන්නේය.

- **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

මෙම ප්‍රඥප්තියේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ (මින් මතු දෙපාර්තමේන්තුව වශයෙන් හඳුන්වනු ලබන) පිහිටවනු ලබන ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, එම නාමය හා අභිධානය යටතේ ඌව පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය.

- **පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා**

මෙම ප්‍රඥප්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිණිස දෙපාර්තාමේන්තුවේ සෙසු ධූරයන් වශයෙන් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ධූරයන්ද මෙයින් පිහිටවනු ලබන අතර, දෙපාර්තමේන්තුවේ ධූරයන් හා සෙසු තනතුරු සඳහා පත් කිරීම සම්බන්ධයෙන් 1987අංක 42 දරණ පළාත් සභා පනතේ අංක 32 වගන්තියේ විධිවිධාන අදාල වන්නේය.

- **ලේකම්වරයා සතු බලතල**

මෙම ප්‍රඥප්තියේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව ඌව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ කෘෂිකාර්මික විෂයභාර අමාත්‍යවරයාගේ (මෙහි මින් මතු අමාත්‍යවරයා වශයෙන් හඳුන්වනු ලබන) විධිවිධාන යටතේ ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම භාර තැනැත්තා වන්නේය.

- **කෘෂිකර්ම අධ්‍යක්ෂවරු පත් කිරීම**

මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා මෙහි දෙවන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ අධ්‍යක්ෂක ධූරය සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පළමුවන පන්තියේ නිලධාරියෙකු ආණ්ඩුකාරවරයා විසින් පත් කළයුතුය.

**අරමුණු**

- ඌව පළාත තුළ කෘෂිකාර්මික ව්‍යාප්තිය, කෘෂිකාර්මික අධ්‍යාපනය, පරියේෂණ කටයුතු මෙන්ම පහත සඳහන් විධිවිධානයන්ද ක්‍රියාත්මක කරනු ඇත. නව කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් හා ප්‍රචාරණ කටයුතු තුළින් පළාතේ කෘෂිකාර්මික සංවර්ධනය ඉහළතලයකට ගෙන ඒම සඳහාත්, ගොවි ජනතාවගේ ජීවන තත්වය උසස් කරලීමත් පදනම් වූ පුළුල් වැඩසටහනක් සංවිධානය කිරිම හා පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම මෙම ප්‍රඥප්තියේ අරමුණු වන්නේය.

**කෘෂිකර්ම ව්‍යාප්තිය හා ප්‍රවර්ධනය**

- ☞ සාම්ප්‍රදායික දේශීය බෝගවලට මෙන්ම, අළුතින් හඳුන්වා දී ඇති, හඳුන්වාදෙන බෝග සඳහා ප්‍රශස්ථ ව්‍යාප්ති කළාප හඳුනාගැනීමත්, ඒ අනුව අදාල බෝග වගාවන් ප්‍රචලිත කිරීම හා ඉලක්ක කර ගත් ක්ෂේත්‍ර ව්‍යාප්ති කටයුතු සංවිධානය කර, ක්‍රියාත්මක කිරිම.

- ☞ නව ආර්ථික බෝගවල ඵලදායිතාවය වැඩි කිරීමේ උපාය මාර්ග ඉවහල් කර ගනිමින්, පළාත තුල ආදර්ශ වගාවන් පවත්වාගෙනයාම මඟින් ගොවිජනතාව එම උපාය මාර්ග වැළඳගැනිමට පෙළඹවීමත්, ඒ තුළින් පවුල් ඒකකයන්හි ආදායම ඉහළ තලයකට ගෙන ඒම.

- ☞ වගාබිම් ක්ෂේත්‍රය පුළුල් කිරිමට වඩා තිබෙන වපසරිය උපයෝගි කරගනිමින් ආදායම් වැඩි කර ගැනීමේ අවශ්‍ය තාවයක වැදගත්කම සම්බන්ධයෙන් ගොවියා දැනුවත් කිරිම හා එමඟින් ඇතිවන ආර්ථික වාසි පිළිබඳ අවබෝධය ලබාදීම.

- ☞ ජාතික කෘෂිකාර්මික නිෂ්පාදනයේ ඌව සලාකය පැහැදිලිව හඳුනාගෙන එම නිෂ්පාදන ධාරිතාව ඉලක්ක කර ගත් ව්‍යාප්ති වැඩසටහනක් දීර්ඝ කාලීනව තිරසාර අන්දමින් ක්‍රියාත්මක කිරිම.

- ☞ සුළු ගොවි කණ්ඩායම් සංවිධානය කිරිම තුළින් කෘෂි ව්‍යාප්ති කටයුතු ක්‍රමවත් කිරිම.

- ☞ කෘෂිකර්මයට අදාල වපසරිය, බෝග, වාර්ෂිකව වගා කන්නයක් අනුව නිෂ්පාදනය, බලාපොරොත්තු ඉලක්ක සම්බන්ධයෙන් වන තොරතුරු ඇතුලත් පරිසණක දත්ත පදධත්යක ජ්ත්ට        වෲම, යාවතකාලීනව පවතවාගෙනයාම

**කෘෂිකාර්මික පර්යේෂණ හා ව්‍යාප්තිය**

- ▶ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස නිරන්තරයෙන් හඳුන්වාදෙන නව තාක්ෂණික ක්‍රමවේදයන් පළාත තුළට කඩිනමින් ගෙන ඒමට සැලැස්වීමෙන් එම ක්‍රමවේදයන් ගොවිජනතාවට මනා සේ උකහා ගැනීමට අවස්ථාව සලසාදීම තුළින් ඒවායින් ලැබෙන ප්‍රතිලාභ ගැන දැනුවත්වීමට ඉඩකඩ සැලසිම

- ▶ ඉහළ ඉල්ලුමක් වැඩි ආර්ථික ලාභයක් ඇති නව බෝග විශේෂ හඳුන්වාදීමේ පුළුල් වැඩසටහන් සඳහා     දෙපාර්තමේන්තුව ආශ්‍රිත වැඩසටහන්වලට ප්‍රමුඛත්වයක් ලබාදීමත

- රසායනික පොහොර භාවිතය, කෘමිනාශක භාවිතය විධිමත් කිරිම මෙන්ම කාබනික පොහොර හා දේශීය කෘමි පාලන ක්‍රම භාවිතයද ප්‍රචලිත කිරිම.
- නව වර්ග හා ප්‍රභේදවලට අයත් ගුණාත්මක බීජ, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ආනයනය කර බෙදාහැරීම වැනි සේවා පහසුකම් සුලභ කිරිම.
- බෝග කාණ්ඩ ලෙස (Block) වගා ක්ෂේත්‍ර පිහිටුවීම
- පටක රෝපණ වැනි නව තාක්ෂණ ක්‍රම මඟින් දියුණු කරන ලද කාර්යයන් ගොවි ජනතාවට සුලභව හා පහසුව ලබාගැනීමට අවස්ථාව සැලසිම.
- කෘෂිපාදක කර්මාන්ත හඳුන්වාදීම, එම නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීම.
- ගෙවතු වගා සංවර්ධනයට අදාල මීමැසි පාලනය, ව්‍යාපාරික මල් වගාව ප්‍රචලිත කිරිමට දායකවීම.
- ගුණාත්මක කෘෂි නිෂ්පාදන අලෙවියට සහයවිම.
- අනුග්‍රහ දායකත්වය ලබාදෙන කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

**අධ්‍යක්ෂවරයා සතු බලතල**

**මෙකී ප්‍රඥප්තියේ සඳහන් අරමුණු ගොනු කර ගැනීම පිණිස වූ පහත සඳහන් බලතල අධ්‍යක්ෂවරයා සතු වන්නේය.**

- කෘෂිකර්ම සංවර්ධනය සඳහා වෙන්වන ප්‍රතිපාදන සැලසුම්ගත වැඩසටහන් මඟින් කාර්යක්ෂමව හා මනා අධීක්ෂණයෙන් යුතුව ගොවි ජනතාවට උපරිම ප්‍රතිපාදන ලැබෙන අයුරින් ක්‍රියාත්මක කිරිම.
- දේශිය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලැබෙන අයුරින් පළාතට ගැලපෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම තුළින් ගොවි ආර්ථිකය නංවාලීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති, පළාත් සභාවේ ප්‍රතිපත්ති පාදක කරගත් වැඩසටහන් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම තුළින් පළාතේ කෘෂි නිෂ්පාදනය හා ගොවි ආර්ථිකය ඉහළ නැංවීම මඟින් රටෙහි ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබාදීමට කටයුතු කිරීම.

- විවිධ ආයතන මඟින් යෝජිත කෘෂිකාර්මික වැඩසටහන් මනාව අධ්‍යයනය කර, පළාතට ගැළපෙන අයුරින් ක්‍රියාවට නැංවීමට අනුමැතිය ලබාදීම.
- ගොවි නිෂ්පාදනවලින් කෘෂි පාදක කර්මාන්ත බිහි කිරිම හා නිෂ්පාදන අලෙවිය ලියාපදිංචි බලයලත් නිලධාරියා ලෙස ක්‍රියාත්මක කිරිම.
- විශාල ලෙස අපතේ යන කෘෂි නිෂ්පාදන ප්‍රමාණය අවම කිරිම සඳහා පසු අස්වනු තාක්ෂණ කටයුතු ක්‍රියාවට නැංවීමේ නිසි බලධාරියා ලෙස කටයුතු කිරීම.
- පළාත තුළට ගෙන්වනු ලබන විවිධ බීජ රෝපණ ද්‍රව්‍ය නිසිලෙස පාලනය කිරීමේ ක්‍රමවේද අදාල ආයතන සමඟ සහ සම්බන්ධතාවය ගොඩනගාගනිමින් ක්‍රියාත්මක කිරිමේ බලධාරියා ලෙස කටයුතු කිරීම.
- කෘෂිකාර්මික කටයුතු සඳහා රාජ්‍ය ආයතනවලින් ලබාගන්නා ණය අනිවාර්යයෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහාම යොදවන බවට නිර්දේශයන් ලබාදීමෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා ණය ලබාගැනීම ක්‍රමවත් කිරීමට සහයවීම.
- කෘෂි නිෂ්පාදන කටයුතුවලට එල්ලවන නොයෙක්තු බාධා ඉවත් කිරීමට අදාල නීති රෙගුලාසි සම්පාදනයට දායකවීම හා එම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ බලධාරියා ලෙස කටයුතු කිරීම.

**තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම.**

- මෙකී ප්‍රඥප්තියෙන් පැවරුණු අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අවශ්‍ය දත්ත හා තොරතුරු රැස්කර ගැනීම පිණිස තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම පිණිස අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරින් විසින් කටයුතු කළ යුතුය.

**ප්‍රගති සමාලෝචනය හා පසු විපරම.**

මෙකී අරමුණු සාර්ථකව ඉටු කරනු ලැබුවේද යන්නෙහි ප්‍රගතිය පරීක්ෂා කිරීම පිණිස නියම කරගත් පරිදි ප්‍රගති සමාලෝචන රැස්විම කැඳවීම, ප්‍රගති වාර්තා කැඳවීම, අපේක්ෂිත ප්‍රගතිය සඳහා ළඟාවීම පිණිස වූ බාධක හඳුනාගැනීම හා එයට පිළියම් යෙදීම පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරින්ගේ වගකීම වන්නේය.

**තොරතුරු කැඳවීම**

- මෙකී ප්‍රඥප්තියෙන් පැනවෙන බලතල ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු විසින් අවශ්‍ය තොරතුරු ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම අදාල තොරතුරු සැපයිය යුතු අතර, එසේ ඉල්ලා සිටින තොරතුරු සැපයීමට අපොහොසත් වන හො ප්‍රතික්ෂේප කරන පුද්ගලයෙකු වරදක් කළා සේ සලකා කටයුතු කළයුතුය.

**ලිඛිත නීතියට අනුකූල බව**

මෙම ප්‍රඥප්තියේ සඳහන් අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස වූ සියළු ක්‍රියාකාරකම්පවතින ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල වියයුතුය.

**බලතල පැවරීම**

මෙකී ප්‍රඥප්තියේ සඳහන් අරමුණු සාධනය පිණිස අධ්‍යක්ෂවරයා වෙත පැවරුණු බලතල කලින් කලට අවශ්‍ය පරිදි නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්, සහකාර කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන නිලධාරියෙකුට හෝ වෙනතු යම් නිලධාරියෙකු වෙත ලිඛිතව පවරා දිය යුතුය.

**දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සංයුතිය හා කාර්යයන්**

- දිස්ත්‍රික් ලේකම්වරයා පළාතතුළ පිහිටි දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සභාපතිවරයා වන අතර, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ ලේකම්වරයා වියයුතුය.

    - දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම ආයතන ප්‍රධානීන්ගේ සහභාගිත්වය අනිවාර්යයෙන් ලබාදියයුතුය.

    - දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව විසින් දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම සංවර්ධනයට අදාල කටයුතු සාකච්ඡා කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සහයවීම. කෘෂිකර්ම ක්ෂේත්‍රයසෙම්බන්ධ ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම, වගා හානි සම්බන්ධයෙන් වාර්තා කැඳවීම හා ඒ සම්බන්ධයෙන් පිළියම් යෙදීම, කුඹුරු ඉඩම් ගොඩකිරීම පිළිබඳ තීරණ ගැනීම, විශේෂ ව්‍යාපෘති සාකච්ඡා කිරීම හා අනුමත කිරීම, නව ව්‍යාපෘති සැලසුම් කිරීම, ප්‍රා

දේශීය කෘෂිකර්ම කමිටුවෙන් ලැබෙන වාර්තා සමාලෝචනය කිරිම, කෘෂිකාර්මික ප්‍රගතිය විමසා බැලීම ආදී කාර්යයන් සිදුකරනු ලබන්නේය.

**ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ සංයුතිය හා කාර්යයන්**

▶ ප්‍රාදේශීය ලේකම්වරයා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ සභාපතිවරයා වන අතර, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ කෘෂිකර්ම උපදේශකවරයා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ ලේකම්ධූරය දැරිය යුත්තේය.

ප්‍රාදේශීය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රා දේශීය කෘෂිකර්ම කමිටුව සඳහා ප්‍රාදේශීය මට්ටමින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල සියළුම ආයතන ප්‍රධානීන් අනිවාර්යයෙන්ම සහභාගිවියයුතුය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කෙරෙන කෘෂිකාර්මික කටයුතු සාකච්ඡා කිරිමට හා ක්‍රියාත්මක කිරිමට සහායවීම, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ගනුලබන තීරණ කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරිමට සහායවීම, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල ආයතන සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනගාගනිමින් සම්බන්ධීකරණය කිරීම,කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සැලසුම් සකස් කිරිමේදී සහායවීම, ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ කාර්යය භාරය වන්නේ

▶ **උපදේශක කමිටුව ස්ථාපිත කිරීම**

අමාත්‍යවරයා විසින් පහත සඳහන් පරිදි උපදේශක කමිටුවක් ස්ථාපිත කළයුතු වන්නේය.

(1) උපදේශක කමිටුව සඳහා නිල බලයෙන් පත්කළ යුතු කමිටු සාමාජිකයන් පහත සඳහන් පරිදි වේ.

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්,

(ආ) කෘෂිකර්ම අධ්‍යක්ෂ,

(ඇ) බදුල්ල, මොණරාගල දිස්ත්‍රික්කයන් නියෝජනය කරනු ලබන නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

(ඈ) පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා,

(ඉ) රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය ඇතිව බදුල්ල, මොණරාගල දිස්ත්‍රික්කයන්හි ගොවිජන සේවා සහකාර නිලධාරින්,

(2) පත්කළ සාමාජිකයින් මෙහි මින් මතු (පත්කළ සාමාජිකයින් යනුවෙන් හඳුන්වනු ලබන)

අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ගොවි සංවිධානයන්හි නිලධාරින් හතර දෙනෙකි.

(3) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම මෙම උපදේශක කමිටුවේ සභාපතිවරයා වන අතර අධ්‍යක්ෂවරයා ලේකම් ලෙස කටයුතු කළයුතුය.

**උපදේශක කමිටුවේ වගකීම**

(1) (අ) මෙම ප්‍රඥප්තියේ අරමුණු සාධනය පිණිස විෂයභාර අමාත්‍යවරයා වෙත යෝජනා ඉදිරිපත් කිරිම.

(ආ) කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල කවර නම් කාර්යයක් සම්බන්ධයෙන් වුවද කෘෂිකර්ම අමාත්‍යවරයාට උපදේශනයන් ලබාදීම.

**පරිපාටි සකස් කිරීම**

උපදේශක කමිටුව ක්‍රියාත්මක කළ යුතු ආකාරය සම්බන්ධව හා ඊට අදාල කවර නම් කාරණයක් සම්බන්ධයෙන් වුවද පරිපාටි සකස් කිරීම අමාත්‍යවරයා විසින් කළයුතුය.

**සාමාජිකත්වය අහෝසි වීම**

- අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් සාමාජිකත්වයෙන් ඉවත් කිරීම පිණිස වූ විධිවිධාන යෙදිය යුත්තේ අමාත්‍යවරයා විසිනි. මෙකී සාමාජිකයෙකු විසින් තම ඉල්ලා අස්වීම ලිඛිතව අමාත්‍යවරයා වෙත භාරදීමෙන් සිය සාමාජිකත්වය අහෝසි වන්නේය.

- කමිටුවේ වෙනත්සාමාජිකයෙකු අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමෙන් හෝ වෙනත් කාරණා හේතුවෙන් කමිටුවේ කටයුතු ඉටු කිරීමට නොහැකි අවස්ථාවල අමාත්‍යවරයා විසින් කමිටුවේ රාජකාරි ආවරණය කිරීම පිණිස වෙනත් නිලධාරියෙකු අවස්ථානුකූලව පත්කළයුතු වන්නේය.

**ධූර කාලය**

- කමිටුවේ සාමාජිකයෙකු සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වුවහොත්, සාමාජිකත්වය හැරගියහොත් හෝ සාමාජිකත්වය අහෝසිකරනු ලැබුවහොත් මිස පත් කළ දින සිට අවුරුදු 03ක කාලයක් මෙම කමිටුවේ සාමාජිකත්වය දැරුය යුතු වන්නේය.

**ප්‍රාදේශීය උපදේශක කමිටු සංයුතිය**

- පළාතේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ක්‍රියාත්මක වන කලාපයන් සඳහා වන කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම පිණිස ප්‍රා දේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පහත සඳහන් සංයුතියට යටත්ව උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කළයුතුය.

- එකී ප්‍රාදේශීය උපදේශක කමිටුවේ සංයුතිය පහත අයුරින් සමන්විත වේ.

  (අ) ප්‍රාදේශීය ලේකම්වරයා

  (ආ) අදාල බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු

  (ඇ) කොට්ඨාශයේ සියළුම ගොවිජන සේවා කමිටු සභාපතිවරුන්

  (ඈ) කොට්ඨාශයේ සියළුම සියළුම කෘෂිකර්ම උපදේශකවරුන්

  (ඉ) කොට්ඨාශයේ ගොවිජන සේවා කමිටු බල ප්‍රදේශයකින් එක් ග්‍රාම සේවා නිලධාරියෙකු බැගින්

- ප්‍රාදේශීය ලේකම්වරයා එකී කොට්ඨාශයේ ප්‍රා දේශීය උපදේශක කමිටුවේ සභාපති වියයුතුය.

- එම කමිටුවේ ජ්‍යෙෂ්ඨ කෘෂිකර්ම උපදේශකවරයා එහි ලේකම් තනතුර දැරිය යුතුය. කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන නිලධාරින් විසින් මෙකී ප්‍රාදේශීය උපදේශක කමිටුවේ සැලකිල්ල යොමු කරනු ලබන සියළුම කරුණු නිශ්චිත කාලයක් තුළදී නියමිත ආකාරයට අවසන් කළයුතුය.

**ප්‍රාදේශීය උපදේශක කමිටුවේ කාර්යය භාරය**

- කෘෂිකර්ම ක්ෂේත්‍රයට කෘෂිකර්ම සංවර්ධනයට අදාලව අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබාදීම හෝ ගැටළුසහගත අවස්ථාවන්වලදී අවශ්‍ය උපදෙස් ලබාදීම.
- උපදෙස් දීම සම්බන්ධයෙන් වාර්තා තබාගැනීම, අවශ්‍ය දත්ත හා තොරතුරු රැස් කර තබාගැනිම හා අවශ්‍ය තොරතුරු කැඳවීම.

**රෙගුලාසි පැනවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල**

මෙම ප්‍රඥප්තියේ අරමුණු යටතට ගැනිය හැකි යම් කරුණක් සම්බන්ධයෙන් ඇතුළු පහත සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවිය යුතුය.

- ❖ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල ප්‍රතිපත්ති සකස් කිරිම
- ❖ කෘෂිකර්මාන්තයේ නියුතු ජනතාව වෙත සහන සැලසිම.

අමාත්‍යවරයා විසින් පනවන ලද රෙගුලාසි හැකිතාක් ඉක්මනින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළයුතුය. පළාත් සභාව විසින් අදාල රෙගුලාසි අනුමත කිරිම හෝ පරිච්ඡින්න කිරිම පිළබඳව අමාත්‍යවරයා විසින් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත්කළයුතුය.

අමාත්‍යවරයා විසින් පනවන ලද රෙගුලාසි ක්‍රියාත්මකව පවතිද්දී පළාත් සභාව විසින් එය පරිච්ඡින්න කරනු ලැබුවහොත් එසේ පරිච්ඡින්නවීමේදී එකී නියෝග යටතේ එතෙක් ලන්නා ලද ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි එකී නියෝග පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතුය.

**අර්ථ නිරූපණ**

- පද සම්බන්ධයෙන් අනර්ථයක් වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි:-

"අමාත්‍යවරයා" යන්නෙන්, ඌව පළාතේ කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

"පළාත් සභාව විසුරුවා හැරුණු අවස්ථාවක අමාත්‍යවරයා" යන්නෙන්, ඌව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"ප්‍රාදේශීය ලේකම්වරුන්" යන්නෙන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පරිපාලන බලධාරින් අදහස් වේ.

"වෙනත් නිලධාරින්" යන්නෙන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ කාර්යයන් ඉටු කිරිම පිණිස රාජකාරීමය වගකීම පැවරුණු නිලධාරින්ය.

මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.